Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education



# ජන ගායනාවල සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

- නර්තනය සමග යෙදෙන ප්‍රධාන අංගයක් ලෙස ගායනය හැඳින්විය හැක.
- ඉදිරිපත් කරන නර්තනය ප්‍රසාංගික ගුණයත් නර්තන අංගය රසවත් කිරීමටත් ගායනය රුකුලක් වේ.
- ගායනයක් ඉදිරිපත් කිරීමේ දී මූලික කරුණු 05ක් සඳහා අවධානය යොමු කළ යුතුය.

✓ ගායනයට අදාළ ප්‍රස්තුතය
✓ නිවැරදි නාද මාලාව
✓ රිද්මය හා තාලය
✓ නිවැරදි ශ්‍රැතිය

## හටන් කවි

- පැරණි රාජධානි සමයේ ඓතිහාසික සටන් පසුබිම් කරගෙන සකස් වූවකි.
- සටනේ වීරත්වය ඉස්මතු වන පරිදි රචනා වූවකි.
- මෙම ගායනා මගින් වීරත්වය, අභීත බව, රණකාමීත්වය වැනි ලක්ෂණ පෙන්නුම් කරයි.
- එමෙන්ම වීරත්වය , ත්‍රාසය, කෲරත්වය වැනි ලක්ෂණ පෙන්නුම් කරයි.
- පරංගි හටන , ඉංග්‍රීසි සටන , දුනුවිල සටන, කොන්ස්තන්තීනු සටන, ආදිය උදාහරණ ලෙස ගත හැක.
- විවිධ තාල රූප අනුව ගායනා කරයි.



**මාත්‍රා 3 - 4 තාල රූපය**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ය | නෙ | න | ක | ළු | ග | හ | එ | ත | ර | වැ | ඩ | සි | ට |
| රු | පු | න් | ය | න | ම | X | බ | ල | ව | බ | ල | වා | - |
| දි | ලෙ | න | ර | න් | ක | ග | අ | ත | ව | අ | ර | ගෙ | න |
| වි | දු | ලි | ය | ක් | සේ | - | ලෙ | ල | ව | ලෙ | ල | වා | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

තෙලිත කෙළියක් ලෙසට සතුරන් කපා දමමින් එළව එළවා
වඩිනවා දැක රාජසිංහ හිමි දුවති රුපුවන් ඉරව ඉරවා

යුද්දෙටත් ඇවිත් සිදුපිට නැව් නැගිලා පරංගි
උන්නනමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා
අන්දමත් සොඳයි කිසි බිසි සී ගාලා කොළඹදි
කම්පලත් නැතත් සෙනගක් මරාදාලා

## මෝල් ගස් කවි

- අතීතයේ යන්ත්‍ර යන්ත්‍ර සූත්‍ර නොතිබූ යුගයේ සහල් සකස් කරන ලද්දේ වංගෙඩිය ලා මෝල් ගසින් කොටා කුල්ලෙන් පොලා ගනිමිනි.
- කාර්යයක් කරනමුත් මෙහෙ ගී ගණයට අයත් නොවේ



මෝල්ගස් නැටුම

**මාත්‍රා 3 කාල රූපය**

වැ කණ්ඩියේ යට කුඹුරේ පුවාලු
නිල් කණ්ඩියේ බිම පැදුරේ වනාලු
රන්යේ බන්දියේ සැලෙනා අත පුරාලු
නැනන්ඩි යේ වනත ට වී කොටාලා

| | | | |
|---|---|---|---|
| 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |
| වැ ක ණ් | ඩි යේ - | ය ට කු | ඹු රේ - |
| පු වා - | ලු - - | | |

ඉතිරි පද දෙස ප්‍රස්ථාර කරන්න

දිවි කදුරුද ගස එතැන තියෙන්නේ
සත් වියතක් දිග මොහොල කපන්නේ
රන් විලි දෙකොන ට හොඳින් තනන්නේ
සත්දින දොස හැර දෙපා තබන්නේ

## ග්‍රහපන්ති කවි

- බලි ශාන්ති කර්ම වලදී නවග්‍රහයන් වෙනුවෙන් ගායනා කරන්නකි.
- නර්තනයට වඩා ගායනයට ප්‍රධාන තැන හිමිවේ.
- සෙතක්, ශාන්තිය අපේක්ෂා කරයි.
- හිරු, සඳු, කුජ, බුධ, සිකුරු, සෙනසුරු, රාහු, කේතු යන ග්‍රහයන් නවදෙනා අයත්ය.
- බලි ඇදුරා බෙර වාදනයට අනුව දකුණු අතට අත්මිණිය ගායනා කරමින් නර්තනයේ යෙදේ.
- ග්‍රහයන්ට ආරාධනා කිරීමට හා ආතුර සෙත් පැතීම කරනු ලැබේ.




| | | | |
|---|---|---|---|
| 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 | 1 2 3 4 |
| + + ඉන් - | දා - දි - | සා - - - | ව - ට - |
| + + ඉ ඹුල් | - - වි - | මා - - - | නෙ - ට - |
| + + හි රු | දෙ - වි - | අ - ධි - | ප - ති - |
| + + වන් - | නේ - - - | - - - - | - - - - |

රන්සිරි බැස ගෙන බැස ගෙන සුරත දරා ගෙන තුරගෙකු පිට වැව ඉන්නේ
ඇති යම් රෝදුක් දුරැර දමා නිති විරාත් කලක් වැජඹෙන්නේ
ඉන්දා දිසාවෙන් හිරු දෙවි වැඩලා ග්‍රහ මේ දොස දුරලන්නේ

**මාත්‍රා 3 කාල රූපය**

සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා
සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙසා
පිරි බලි කොකු මෙන් ඉඳුරේ නිවෙසා
හිරු දෙවි මේ ඔබට දෙන් සෙත සලසා

# කාර්ය පත්‍රිකාව

1) මෝල්ගස් සැකසීම සඳහා ................ ගසේ ලී යොදා ගැනේ
2) මෝල්ගස් නැටුම සඳහා ................ එන කවි වර්ගයක් වන ..................... කවි යොදා ගැනේ.
3) මෝල්ගස් නැටුම වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ ....................... මහත්මියටයි.
4) ඉහත දක්වා ඇති මෝල්ගස් කවියේ ඉතිරි පද අදාළ තාලරූපයට ප්‍රස්තාර කරන්න.

1) ග්‍රහ පන්ති කවි ......................... ශාන්ති කර්මය එන කවි ගායනා විශේෂයකි.
2) ග්‍රහයින් නව දෙනා නම් කරන්න.
3) කවි ගායනයේදී අත්‍යාවශ්‍ය තාලවාද්‍ය භාණ්ඩය ලෙස ..................... යොදා ගනී.
4) ඉහත දක්වා ඇති ග්‍රහ පන්ති කවියේ ඉතිරි පද ප්‍රස්ථාර කරන්න.

1) හටන් කාව්‍ය සඳහා උදාහරණ 4ක් ලියන්න.
2) හටන් කවි රචනා වීමට හේතු 2 ලියන්න.
3) ඉහත සඳහන් හටන් කවියේ ඉතිරි පද ප්‍රස්ථාර කරන්න.

ඉගෙනුම් ආධාරක

https://www.youtube.com/watch?v=YP2B3Lueszk&t=169s

https://www.youtube.com/watch?v=AQtIUdkeLaI

https://www.youtube.com/watch?v=p52sMogti3I

https://www.youtube.com/watch?v=BBYhrhJjOU8